# ඓතිහාසික ලේඛන කලාව හා ලේඛන මාධ්‍යයන් පිළිබඳ විමසීමක්

පාතකඩ රේවත හිමි

## හැඳින්වීම

ලේඛනය මිනිස් ශිෂ්ටාචාරයේ උසස් බව කියාපාන සංවර්ධනීය ලක්ෂණයක් වශයෙන් හඳුන්වා දිය හැකිය. ආදි කාලීන මිනිසා ක්‍රමානුකූලව ශිෂ්ටාචාරවත්ම ලේඛනයටද ක්‍රමයෙන් හුරු වී ඇති ආකාරය ඓතිහාසික සාධක මත සනාථ වේ. සමාජයක් ශිෂ්ටාචාරවත් වීමේදී ලේඛනයෙන් ද වැදගත් කාර්යභාරයක් ඉටු වේ. මිනිසාගේ සිතුම් පැතුම්, මතක සටහන් තැබීම්, අදහස් ප්‍රකාශ කිරීම්, නව සොයා ගැනීම් සටහන් කර තැබීම් යනාදී දෙයට ලේඛන කලාවක් අවශ්‍ය වන්නාක් මෙන්ම ශිෂ්ටාචාරයේ දියුණුවීම් ඇති වන්නේ ද එවැනි අදහස් අත්දැකීම් මතු පැවත එන්නන්ගේ දැනගැනීම සඳහා ලේඛනගත කර තැබීමෙනි. ඒ සඳහා ලේඛනයට අවශ්‍ය අක්ෂර හෝ සංකේත ක්‍රමයක් තිබිය යුතු අතරම ලේඛන මාධ්‍යයක් ද සකස් කර ගත යුතුය. මුල් කාලීන මිනිසා විසින් එම කාර්යයන් සාක්ෂාත් කර ගනු ලැබුයේ කෙසේද යන්න පිළිබඳ විමසීමක් මෙමගින් සිදුකෙරේ.

## පර්යේෂණයේ අරමුණු

1. ඓතිහාසික ලේඛන කලාව හඳුනා ගැනීම.
2. සිංහල ලේඛනයේ ආරම්භය විමසා බැලීම.
3. ඉපැරැණි ලේඛන මාධ්‍යයන් පිළිබඳ විමර්ශනය කිරීම.

## පර්යේෂණ ගැටලුව

ඓතිහාසික ලේඛන කලාව හා ලේඛන මාධ්‍යයන් පිළිබඳ විමර්ශනය කිරීම මෙහි පර්යේෂණ ගැටලුවයි.

**පර්යේෂණ ක්‍රමවේදය**

ලේඛන කලාවේ ඉතිහාසය පිළිබඳව ලියවී ඇති විවිධ පොතපත සහ ලිපි ලේඛන අධ්‍යයනය මෙම පර්යේෂණයේ තොරතුරු රැස්කළ ක්‍රමවේදයයි. ගුණාත්මක දත්ත සහ තොරතුරු රැස් කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කරන ලදී.

**ලේඛනය**

පාලි සිංහල ශබ්දකෝෂයට අනුව ලේඛන සම්බන්ධ වචන සඳහා ලබා දී ඇති අර්ථයන් මෙසේය.

ලෙඛ- හසුන් පත, ලිවීම, දඬු ආදිය ලියවූ කුඩු

ලේඛක- ලියන්නා

ලේඛන- ලියමන

ලේඛනී- පින්සල, තෙල්කූර, පන්හිඳ, පැන්සලය, පෑන (සිරි සුමංගල හිමි, මඩිතියවෙල, 1965).

ලේඛන ශබ්දයට අරුත් සපයන සංස්කෘත සිංහල ශබ්දකෝෂයේ පහත පරිදි අර්ථ දක්වා තිබේ.

ලේඛ- ලිවීම

ලේඛක- ලියන්නා, සිත්තරා

ලේඛන- ලියන, අඳින

ලේඛනික- පෑන් සාදන බට ලී වර්ගයක්

ලේඛනී- පෑන (අලගියවන්න, පුවතිසි, 2004)

සිංහල ශබ්දකෝෂයේ ලේඛන කලාව යන්නට ලබා දී ඇති නිර්වචනය මෙසේය.

"ලිවීමේ ශාස්ත්‍රය ; යම්කිසි රටාවකට හෝ සම්ප්‍රදායකට

අනුව ලිපි ලේඛන හා පොත් පත් රචනා කිරීමේ ශිල්පය ; "විජය රජු මදුරාපුරයට යවන ලද ලිපිය එකල ලේඛන කලාවක් පැවති බවට සාධකයක් ලෙස විද්වත්හු දක්වති " (සන්නස්ගල, පී. බී. 1992).

මෙලෙස ලේඛන යන්නට පාලි සංස්කෘත සිංහල යන භාෂා ත්‍රිත්වයේම සමාන විග්‍රයක් ඉදිරිපත් කෙරෙන බව පැහැදිලිව දැක්විය හැකිය.

භාෂාව හා ලේඛනය ගත් විට භාෂාව ලේඛනයට වඩා පැරණි බව විද්වතුන්ගේ මතයයි (වජිරකාන්ති,අශෝකා, 2013), එබැවින් භාෂාව ප්‍රාථමික වන අතර ලේඛනය ද්විතීයියක ලෙස හැඳින්වේ. මානවශිෂ්ටාචාරයේ ලේඛනය හෙවත් වාර්තා ලිපිය පහළ වූයේ මුඛ්‍ය වශයෙන් කතාව දෘශ්‍ය රූ සටහන් මගින් වඩාත් අංග සම්පූර්ණව නියෝජනය කර දැක්වීමට දැරූණු දීර්ඝ කාලීන ප්‍රයත්නයක ප්‍රතිඵලවශයෙනැයි පිළිගැනේ (අරංගල, 1992). එය එක්වර දිනකින් දෙකකින් හෝ වසරකින් දෙකකින් ඇති වූවක් නොව වසර සිය ගණනක උත්සාහයක ප්‍රතිඵලයක් බව පෙනී යයි. තමන් වනයේදී දුටු සත්ව රූපයක් හෝ ස්වභාවික සන්සිද්ධියක් තවත් අයෙකුට පැහැදිලි කිරීමට හෝමතක තබා ගැනීමට එය රූපයකට නැගීමේ අවසාන ප්‍රතිඵලය වූයේ අක්ෂරයක් බිහි වීමයි.

**අක්ෂර කලාවේ ආරම්භය**

ඉපැරැණි මානව ශිෂ්ටාචාර යුග වශයෙන් බෙදා දක්වන ඉතිහාසඥයින් විසින් එය ප්‍රධාන යුගතුනකට නම් කොට තිබේ. එනම්

ශිලා යුගය

ලෝකඩ යුගය

යකඩ යුගය වශයෙනි.

නැවත ශිලා යුගය කොටස් තුනකට බෙදේ.

පූර්ව ශිලා යුගය

මධ්‍යම ශිලා යුගය

නව ශිලා යුගය වශයෙනි.

පහළ පූර්ව ශිලා යුගය, මධ්‍යම පූර්ව ශිලා යුගය, ඉහළ පූර්ව ශිලා යුගය වශයෙන් පූර්ව ශිලා යුගය නැවතත් ප්‍රධාන යුග තුනකට දක්වන ඔවුන් පූර්ව ශිලා යුගය හඳුන්වනු ලබන්නේ පැලියෝලිතික යුගය වශයෙනි. තත් කාලීන ඔස්ට්‍රෝලෝපිතේක මානව කල්ප වානරයින් විසින් විවිධ සංකේත භාවිත කරමින් ඔවුනොවුන් අතර සන්නිවේදන සබඳතා ගොඩනගා ගෙන තිබේ. මේ පිළිබඳව සාක්ෂි පැරණි ගුහා සිතුවම් හා සංකේත ඇසුරෙන් සපයා ගැනීමට හැකිය. ඇල්ටමීරා, ලැස්කෝ, කෝගුල් සහ ලා-මැණ්ඩලයින් වැනි ප්‍රාග් ඓතිහාසික ගුහාසිතුවම් වලින් ක්‍රිස්තු පූර්ව 14,000-40,000 දක්වා ප්‍රාග් ඓතිහාසික අතීතයට දිවෙන සන්නිවේදන කලා සම්ප්‍රදායක් පැවති බවට තොරතුරු හමු වේ. (දයානන්ද, 2001).

මෙලෙස ඔවුනොවුන් අතර සන්නිවේදනය සඳහා යොදා ගන්නා ලද රූපාක්ෂර අක්ෂර රටාවන්ගේ මුල ස්වභාවයයි. අක්ෂර විද්‍යාව ඇති වීමට පෙර යොදා ගන්නා ලද එවැනි සංඥාපික්ටොග්‍රාප් (pictograph), අයිඩියොග්‍රාප් (Ideograph) සහ හයිරොග්ලිප් (Hieroglyph) වශයෙන් වර්තමානයේදී හඳුන්වනු ලැබේ. එම සංඥාවල ඇති ලක්ෂණයක් නම් සංඥා සහ හඳුන්වනු ලබන දෑ අතර සමීප සම්බන්ධතාවක් තිබීමයි. උදාහරණයක් නම් මිනිසා විසින් සතෙකු මරණු ලැබුවේ යැයිප්‍රකාශ කිරීම සඳහා මිනිසෙකු ද ආයුධයක් සහ පහරක් ලද සතෙකු ද චිත්‍රයට නැගීමයි (ද සිල්වා, 1993).

ලේඛනය චිත්‍රාක්ෂරයන්ගේ සිට නූතන අක්ෂර හෝඩිය දක්වා වර්ධනය වීමේදී එක් එක් යුගවල එහිවිවිධ අවදීන් පැවති බවට විද්වතුන් විසින් පෙන්වා දී තිබේ. මේ පිළිබඳව අදහස් දක්වන ගැල්බ් මහතා එහි අවදීන් සතරක් දක්වයි.

චිත්‍රාක්ෂර (Pictograph)

ලඝු සංකේත අක්ෂර (Logograph)

ශබ්ද සංකේත අක්ෂර (Syllabic writing)

ශබ්දාක්ෂර (phonems) (වජිර හිමි, හබරකඩ, 2000)

චිත්‍රාක්ෂර යනු රූප සලකුණු මගින් භාෂාව අර්ථවත් කළ අවධියයි. නිශ්චිත වචනයක් වෙනුවට සටහනක් යොදා චිත්‍රයක් භාවිත කළ අවධිය ලඝු සංකේත අක්ෂර යුගයයි. මීළඟට පැමිණෙන්නේ ශබ්ද සංකේත අක්ෂර යුගයයි. එහිදී වාක්‍ය ඛණ්ඩ හෝ අදහස් නැතහොත් ශබ්ද වෙනුවට රූප භාවිත කොට තිබේ.

**ඓතිහාසික සිංහල ලේඛන කලාව**

සිංහල ලේඛනයේ ආරම්භය සිදුවූයේ ක්‍රි. පූ. තුන්වන සියවසේදී පමණ බව මූලාශ්‍රය අධ්‍යයනයෙන් පැහැදිලි වේ. එහි ආරම්භක භාෂාව පිළිබඳ විවිධ මතවාද පැවතුන ද බහුතරයගේ මතය වනුයේ බ්‍රාහ්මීය අක්ෂර කලාව සිංහලයේ මාතෘ භාෂාව වන බවයි. බ්‍රාහ්මීය අක්ෂර කලාව ඉන්දියානු සම්භවයක් සහිත වූවකි. මෙරට වෙනත් සෑම සංස්කෘතිකාංගයක් මෙන්ම ලේඛන කලාව ද ඉන්දියාවෙන් ආභාසය ලබා මෙරට දී සංවර්ධනය වූ බවට ඒ පිළිබඳ අධ්‍යයනයන් මගින් කරුණු  ඉදිරිපත් කෙරේ.

සිංහලයෙහි අක්ෂර මාලාව කවර කලෙක ඇති වීදැයි නිශ්චය වශයෙන් ප්‍රකාශ කිරීමට තරම් සාධක තවම ලැබී නැත. එහෙත් ක්‍රි. පූ. තුන්වන ශතවර්ෂය තෙක් දිවෙන ඉපැරැණි ඉතිහාසයක් ඇති ලංකාවේ සෙල්ලිපි සඳහා මූලික වශයෙන් භාවිත වූයේ බ්‍රහ්මීය අක්ෂර බව අවිවාදයෙන් පිළිගෙන තිබේ (බණ්ඩාර, 2007).

සිංහල භාෂාව කතා කරන ජාතියක් මෙරට බිහි වන්නේ ක්‍රි. පූ. 6වන සියවසේ දී පමණ බව මහාවංශය තහවුරු කරයි. විජයාගමනය මෙහි මූලිකම සාක්ෂිය ලෙස නූතන විද්වත්හු පෙන්වා දෙති. කෙසේ වෙතත් එලෙස සංක්‍රමණය වූ ජනතාවගේ භාෂාව සිංහල නොවූ අතර ඔවුන්ගේ භාෂාව කාලානුරූපීව විකාශය වීමෙන් දේශීය භාෂාවක් වශයෙන් සිංහල භාෂාව සකස් වී තිබේ. ඉන්දියානු සංක්‍රමණිකයන් මෙරටට පැමිණෙන විටත් දේශීය ජන කොටසක් මෙහි පදිංචි වී සිටි අතර ඔවුන්ගේ භාෂාවට මේ ඉන්දියානු  භාෂා අභාසය ලැබෙන්නට ඇති බවට කිසිදු සැකයක් නැත. මෙලෙස ප්‍රථම සිංහල වර්ගයා භාරතයෙන් ලංකාද්වීපයට පැමිණ ඇත්තේ ක්‍රි. පූ 6වන සියවසේ දී වන අතර ඔවුන් හා ඉන් පසුවත් වරින්වර භාරතයේ නොයෙක් දෙසින් පැමිණි තවත් සංක්‍රමණිකයන් ගෙන ආ භාරතීය ප්‍රාකෘත උප භාෂා

විශේෂ ලංකාද්වීපයෙහි එකල වාසය කළ යක්ෂ දේව නාග ආදී රක්ෂ්‍යය නම් වූ මනුෂ්‍ය වර්ගයාගේ භාෂා ව්‍යවහාරය හා මිශ්‍රව අනුක්‍රමයෙන් සිංහල භාෂාව විකාශය වන්නට විය (අභයසිංහ, ඒ. ඒ ; රාජපක්ෂ, ආර්. එම්. ඩබ්, 1989).

යථෝක්ත කාරණාව තහවුරු කරනු වස් කලින් කලට සිංහල භාෂාවේ සිදු වූ වෙනස්කම් උපයෝගී කොට ගත හැක. ක්‍රිස්තු පූර්ව තුන්වන ශතවර්ෂයෙහි පටන් ක්‍රිස්තු වර්ෂ දශවෙනි ශතවර්ෂය දක්වා නොයෙක් අවස්ථාවල සිංහල භාෂාවෙහි පැවති ප්‍රයෝගයන් විමසා බලන විට පෙනී යන්නේසිංහලයෙහි ව්‍යාකරණ රීති ඊට මුල් වූ පුරාණ භාරතීය භාෂාවෙන් (සංස්කෘතයෙහි) තත්සම රීතිවලින් ගන්නා ලද්දේය නොහොත් ඒ මූල රීතීන් අනුව සිංහලයෙහි නිපන් බවයි (නන්දසේන, 2000).

ජේ. බී දිසානායක පෙන්වා දෙන පරිදි සිංහල භාෂාවට මූලාශ්‍රය වූ භාෂා තුනක් අනුමාන කළ හැකි බව දක්වයි. දිසානායකට අනුව සිංහලයට මූලාශ්‍රය වූ භාෂා අයිති රටවල් තුනකි. එනම් වංග රට, ලාළ රට හා කාළිංග රටයි. මහාවංශයේ එන විජයාගමනයේ විවිධ සංසිද්ධීන් ගෙන හැර දක්වමින් මේ බව තහවුරු කරයි. "වංගෙසු වංග නගරෙ වංග රාජා" යන මහාවංශ පාඨයට අනුව විජය රජුගේ මිත්තණියන්ගේ පියාණන් විසුවේ වංග රටේ බැවින් සිංහල භාෂාවේ මූලාරම්භය වංග භාෂාව බව පෙන්වා දෙනු ලැබේ. "ලාළ රටෙය් පුරෙ තසමිං සීහබාහු නරාධිපො රජ්ජං කාරෙසි කත්වාන මහෙසිං සීහ සීවලී" තවද විජය කුමරුගේ මව්පියන් රාජ්‍ය කළ රට වන ලාළ රටේ භාෂාව සිංහල භාෂාවට මූලාශ්‍රය විය හැකිය. විජය කුමරුගේ මිත්තනියන් කතා කළ භාෂාව කලිඟු රටේ භාෂාව වූ බැවින් එය කලිඟු භාෂාව විය හැකිය. "කාලිංග රඤ්ඤො ධීතාසි මහෙසි" (දිසානායක, 1992). එහෙත් එය අනුමානයක් පමණක්ම ලෙස සැලකිය හැක්කේ සිංහල භාෂාව මෙරට ව්‍යාප්ත වූ කාලයේදී ඉන්දියාවේ එවැනි භාෂාවක ලක්ෂණ දැකගත නොහැකි වීම නිසයි.

මේ ආකාරයට සංක්‍රමණිකයන්ගේ භාෂාව කුමක් වුවත් ලක්දිව ආර්ය ජනාවාස පිහිටවූ මුල් අවදියෙහි පටන්ම ලක්දිව සිංහලද්වීපය/ සීහළ දීප /හෙළදිව/සිංහල දේශ/සීහළ දේශ/ හෙළ

දෙස ආදී නම්වලින් හැඳින්වුණු බවටත් එරට වැසියන් සිංහලයන් (හෙළයන්) වශයෙන් හා ඔවුන් භාවිත කළ භාෂාව සිංහල භාෂා/ සීහළ භාෂා (හෙළ/එළුබස) වශයෙන් හැඳින්වුණු බවටත් ප්‍රමාණවත් සාක්ෂ්‍ය ලැබේ (බලගල්ලේ, 1998).

සිංහල භාෂාව සංවර්ධනය විෂයෙහි විජයගේ බලපෑම පමණක් නොව කලින් කලට ඉන්දියවෙන් මෙරටට සංක්‍රමණය වූ විවිධ ජන කොටස්වල බලපෑම ද හේතු වන්නට විය. මේ පිළිබඳව විමර්ශනයක් කරන ලද අහමඩ් හසාන් දානි විසින් ඉන්දියානු පුරාක්ෂර විද්‍යාව නමින් ලියන ලද ආචාර්ය උපාධි නිබන්ධයේ අටවෙනි පරිච්ඡේදයේදී එම බලපෑම සනාථ කළ හැකි සාධක මූලාශ්‍ර පහකට බෙදා දක්වනු ලබයි.

1. සාතවාහන, බටහිර ක්ෂත්‍රප ලේඛන

2. දකුණු ඉන්දියානු ලෙන් ලිපි

3. නැගෙනහිර වෙරළබඩ ඉක්ෂුවාකු සෙල්ලිපි

4. බටහිර වෙරළබඩ කදම්බ හා අනෙකුත් පාලකයන්ගේ ලිපි

5. පල්ලව ග්‍රන්ථාක්ෂර (ලංකාගේ, 1996).

මිහිඳු හිමියන් ප්‍රමුඛ ධර්මදූත පිරිස ලංකාවට පැමිණෙන්නට පෙර දකුණු ඉන්දියාවටත් ලංකාවටත්ජෛන ලබ්ධිකයන් විසින් අක්ෂර කලාව හඳුන්වා දෙන්නට ඇතැයි විශ්වාස කරන අභය ආර්යසිංහ "සිංහල පුරාක්ෂර විද්‍යාව" නම් ආචාර්ය උපාධි නිබන්ධයේදී ක්‍රිස්තු පූර්ව තුන්වනසියවසේ සිට ක්‍රිස්තු වර්ෂ 15 වන සියවස දක්වා අක්ෂර පරිණාමය පිළිබඳ විග්‍රයක් කර ඇත. එහිසිංහල අක්ෂර පරිණාමයේදී ඇති වූ විවිධ බලපෑම් අනුව අවධි සතරක් දක්වා තිබේ.

1. අශෝක බ්‍රාහ්මී

2. දකුණු ඉන්දියානු

3 අර්ධද්වීපික ඉන්දියානු

4. දේශීය වශයෙනි.

මේ ආකාරයට මෙරට ලේඛන කලාව පෝෂණය විෂයෙහි ඉන්දියානු බලපෑමත් දේශීය භාෂා සම්මිශ්‍රණයත් නොයෙක් ආකාරයෙන් සිදු වී ඇති බව දක්විය හැකිය.

ක්‍රිස්තු පූර්ව තුන්වන සියවස සිංහල ලේඛන කලාවේ ලිඛිත සාක්ෂි හමුවන පළමු කාල පරිච්ඡේදයයි. මේ බව සනාථ කළ හැකි සාක්ෂි අතර මෙරටින් හමු වූ ආදීම ශිලා ලේඛනය ද වෙයි. එය ඉපැරැණි බ්‍රාහ්මීය අක්ෂරවලින් ලියවී ඇති අතර මිහින්තලේ ලෙනක දක්නට ලැබේ. "ගමණී උති මහ රජ"යනුවෙන් ලියවී ඇති මෙහි "ගමණී උති" යනු දේවානම්පියතිස්ස රජුගේ (ක්‍රි.පූ. 250-210) ඇවෑමෙන් රජ පැමිණි ඔහු සහෝදර උත්තිය බව හඳුනා ගැනීමට අපහසුවක් නැත (සංස්.හෙට්ටිආරච්චි, 1963). මෙලෙස ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසෙහි පමණ සිට පැහැදිලි ලේඛන ඉතිහාසයක් සිංහල භාෂාවට තිබූ බවට සාක්ෂි හමුවෙයි.

එසේ වුවත් ක්‍රිස්තු පූර්ව තුන් වන සියවසට පෙර සිටම ලේඛන ක්‍රමයක් තිබුණු බවට ඇතැම් ඓතිහාසික කතා පුවත් මගින් ප්‍රකාශ වුවද ඒ පිළිබඳ පැහැදිලි සාක්ෂි හමු නොවේ. මෙරටට පැමිණි ආර්ය පිරිසෙහි නායකයා වන විජය කුමරුගේ අභිෂේකය සඳහා ක්ෂත්‍රිය වංශික කුමාරියක් ගෙන්වා ගැනීමට පඬිරට මධුරාපුර රජු වෙත දූතයන් මගින් හසුන්පත් යවා ඇත. විජය කුමරු විවාහ වූයේ එම හසුන අනුව මෙරටට පැමිණි ක්ෂත්‍රිය වංශික කුමරිය සමඟය. මෙසේ විවාහ වූ විජය රජුට රාජ්‍ය භාරදීමට පුතුන් නොසිටි නිසා සිංහ පුරයෙහි සිටි එතුමාගේ සොයුරු සුමිත්ත කුමරුහට හසුනක් යවනු ලැබීය. අභය රජු (ක්‍රි. පූ. 414-394) විසින් ගඟින් එතෙර වී සිටින ලෙස සඳහන් කරන ලද රහස් හසුනක් පණ්ඩුකාභය කුමරු වෙත යවා ඇත (රණසිංහ, 2006). මෙලෙස ක්‍රි. පූ. තුන්වන සියවසටත් ප්‍රථම පටන්ම මෙරට සාක්ෂරතාවක් සහිත ජන කණ්ඩායම් විසූ බව පැහැදිලි වේ.

ලෙන් ලිපි, ගිරි ලිපි, ටැම් ලිපි, රන් පත්, තඹ පත්, පුස්කොළ පොත්වල ලියූ සන්නස්, තුඩ පත්, සීට්ටු වැනි ලිපි ද පොත් අතර සංස්කෘතයෙන් ලියවුණු බුද්ධදාස රජුගේ සාරාර්ථ සංග්‍රහයත් කුමාරදාස රජුගේ ජානකීහරණයත් සීගිරි කැටපත් පවුරේ ලියූ සිංහල

කවි කිවිඳියන් අතරට සංස්කෘත ශ්ලෝකයක් එකතු කල මජුවර්මන් නැමැත්තෙක් ද සිටීමෙන් ප්‍රකට වන්නේ සිංහල ලේඛන කලාව බ්‍රහ්මීය අක්ෂරයන්ගෙන් උප්පත්තිය ලබා ස්වදේශීය භාෂාවන්ගෙන් පෝෂණය වී බුදු දහම හඳුන්වා දීමෙන් පසු පාලි සංස්කෘත භාෂාවන්ගෙන් තවදුරටත් පෝෂණය වී අංග සම්පූර්ණ භාෂාවක ලක්ෂණ සහිතව එය වර්ධනය වූ බවයි.

**ඉපැරණි ලේඛන මාධ්‍යයන්**

මිනිසා ලිවීමට හෝ ඇඳීමට යම් දවසක මුල පිරුවේ නම් එදා පටන්ම ලේඛන මාධ්‍යයද අවශ්‍ය විය. මීට වසර 35000 කට පමණ ඉහතදී ඔවුන්ගේ ලේඛනය ආරම්භ වූ බවත් ලේඛන මාධ්‍යයන් ද එතරම්ම පැරණි බවත් පෙන්වා දිය හැකිය (G. L. Bashell). නමැති ලේඛකයා සඳහන් කරන අන්දමට මිනිසා සිය ලේඛන කලාව ආරම්භ කර ඇත්තේ පොළොවේ පස් හෝ වැලි මත ලිවීමෙනි (වීරසිංහ, 2002).

මුලදී පොළොවේ පස් හෝ වැලි මත ලිවීමෙන් ආරම්භ වුවත් කල්යත්ම පහසු සහ කල්පවත්නා මාධ්‍යයන් මත ලිවීමට හා ඇඳීමට ඔවුහු පෙළඹුණහ. ඒ අනුව ලේඛන ද්‍රව්‍යයක් වශයෙන් ප්‍රථමයෙන්ම භාවිත කොට ඇත්තේ පාෂාණ බව ඒ ඉස්ඩ්ලි මහතා සඳහන් කරයි. ඊට උදාහරණ ලෙස වසර 50000 ක් පමණ පැරණි ගුහා සිතුවම් පෙන්වා දීමට හැකිය. ප්‍රංශයේ ලැස්කෝ ස්පාඤ්ඤයේ ඇල්ටමීරා මීට හොඳම උදාහරණ වේ (වීරසිංහ, ඩබ්ලිව්, 2002).

ආදි කාලීන මානවයා පාෂාණ ලේඛන ද්‍රව්‍ය වශයෙන් යොදා ගෙන ඇති බව අපට දැක ගත හැකි වනුයේ ඒවා කාලාන්තරයක් නොනැසී පවතින බැවිනි. ඊට අමතරව එක් එක් පරිසරයන්ට අනුකූලව පහසුවෙන් සොයා ගත හැකි කොතෙකුත් ලේඛන ද්‍රව්‍යයන් ඔවුන් විසින් භාවිත කරන්නට ඇති බව ලේඛන විද්‍යාඥයන්ගේ අදහසයි. පාෂාණ ලේඛන අපට හමුවන නිසා ඔවුන් ඒවා මුලින්ම භාවිත කළ බවටත් අනෙකුත් ලේඛන මාධ්‍යයන්ට සාපේක්ෂව බහුලව භාවිත කළ බවටත් නූතන විද්වතුන් විසින් පෙන්වා දෙනු ලැබේ. ඊට අමතරව භාවිත කරන්නට ඇති ලේඛන ද්‍රව්‍යයන් විශාල ප්‍රමාණයක් කාලයාගේ ඇවෑමෙන් විනාශ වී ගොස් තිබේ.

පාෂාණවලින් පසු ශිෂ්ටාචාර යුගයන් පැවති ප්‍රදේශවලින් අපට හමුවන්නේ මැටි පුවරුය. මුල් අවස්ථාවලදී තෙත මැටි ගෙන පුවරුවක් ලෙස සකස්කර ගෙන උල් හැඩැති ආයුධයකින් එහි අක්ෂර කොටා ලේඛනයක් නිර්මාණය කොට ගෙන තිබේ. තෙත මැටි භාවිත කොට සකස් කළ මෙම ලේඛනයන් කල් පවත්වා ගැනීම අසීරු වන්නට විය. මේ නිසා ලියන ලද හෝ ඇඳින ලද මැටි පුවරු පුළුස්සා ගැනීමට සිදුවිය. පුළුස්සා ගත් මැටි පුවරු කාලයක් සුරක්ෂිතව තබා ගැනීමට හැකි වීම නිසා අදටද එවැනි මැටි පුවරු කැණීම් භූමිවලින් හමු වේ. එලෙස හමු වූ ප්‍රථම සහ විශාලම මැටි පුවරු තොගය සොයා ගන්නා ලද්දේ 1843 දී ප්‍රංශ ජාතික පවල් එමිලා බොත්තා (Paval Emila Botta) විසිනි (වීරසිංහ, 2002). මැටි පුවරු කාලයාගේ ඇවෑමෙන් විවිධ කැටයමින් ද විවිධ හැඩයන්ගෙන් ද යුක්ත වී තිබේ. ඇතැම් විට විවිධ විෂයන්ට අනුව ඒවායේ හැඩයද වෙනස් වී තිබේ. අතීතයේ මැටි පුවරු ලේඛන සහිත පුස්තකාල පවා බිහි වී තිබීමෙන් එකල කෙතරම් ජනප්‍රිය ලේඛන මාධ්‍යයක් බවට පත් වූවාදැයි පැහැදිලි වේ. උදාහරණ ලෙස ක්‍රි. පූ. 667-627 කාලයේදී බැබිලෝනියාවේ රජ කළ අසුරු බනිපාල් රජතුමා විසින් නිනාවේ නමැති ස්ථානයේ ගොඩනගන ලද පුස්තකාලය පැහැදිලි සාක්ෂියකි.

සිය ගණනක් වූ ලේඛන ද්‍රව්‍යයන් අතුරෙන් පැපිරස් ද එකල ඉතා ජනප්‍රිය ලේඛන මාධ්‍යයකි. ශ්‍රී ලංකාව ප්‍රමුඛ ආසියානු රටවලට ආගන්තුක ලේඛන මාධ්‍යයක් වුවත් මැදපෙරදිග කලාපයේ විශේෂයෙන්ම ඊජිප්තුව වැනි රටවල බහුල වශයෙන්ම භාවිත වූයේ පැපිරස්ය. ලෝකයේ සම්භාව්‍ය ලේඛන රැසක්ම පැපිරස් මත රචනා වී තිබේ. ඉන්දියාව ශ්‍රී ලංකාව වැනි ආසියානු රටවලට පුස්කොළ ලේඛන කලාව කෙතරම් වැදගත් වූයේද එතරමම වටිනාකමක් යුරෝපීය කලාපයට පැපිරස් මඟින් සිදුවිය. පැපිරස් මත සම්භාව්‍ය ලේඛන ගණනාවක්ම රචනා කොට තිබේ. හෝමර්ගේ ඉලියඩ් කාව්‍ය පැපිරස් රෝල් 24 ක් මත රචනා කොට තිබුණි. ඊජිප්තු වාසීන්ගේ ජනප්‍රිය ග්‍රන්ථයක් වූ මළවුන්ගේ ග්‍රන්ථය (The Book of The Dead) රචනා කර තිබුණේද පැපිරස් මතයි (වීරසිංහ, 2002).

ඊජිප්තුවේ නයිල් ගඟ දෙපස සුලභව පැපිරස් වැවීම නිසා ඔවුන්ට ඒවා ප්‍රධාන ලේඛන මාධ්‍ය බවට පත් කර ගැනීමට මහත්

පිටුබලයක් විය. ග්‍රීක රෝම යුගයන්වල ප්‍රධාන ලේඛන මාධ්‍ය වූයේද පැපිරස්ය. ලෝකයේ උසස්ම පැපිරස් නිර්මාණය කර ඇත්තේ ඇලෙක්සැන්ඩ්‍රියාවේ වන අතර ඇලෙක්සැන්ඩ්‍රියානු පුස්තකාලයේ ප්‍රධාන ලේඛන ද්‍රව්‍ය වූයේ ද පැපිරස් ලේඛනයි.

මධ්‍යධරණී ප්‍රදේශයේ ක්‍රි. පූ. දෙවන ශතවර්ශයේ පමණ සිට භාවිත වූ තවත් ලේඛන මාධ්‍යයක් වශයෙන් පාර්ච්මන්ට් හඳුනාගත හැකිය. එළුවන්, බැටළුවන්, ගවයන් වැනි සතුන්ගේ හම් මේවා සකස් කර ගැනීමට යොදා ගන්නා ලදී. කුඩා පැටවුන්ගේ හම් යොදා ගෙන වෙළම් නිෂ්පාදනය කළ අතර ඒවා පාර්ච්මන්ට්වලට වඩා මෘදු හා පහසුවෙන් ලිවිය හැකි මාධ්‍යයක් විය. මේ දෙවර්ගයම පැපිරස්වලට වඩා ලිවීමට පහසු ලේඛන ද්‍රව්‍යයන් වේ. ඊජිප්තුව මෙසපොටේමියාව පර්සියාව පලස්තීනය ආදී ප්‍රදේශවල බහුල වශයෙන් සත්ව හම් භාවිත වී තිබේ. පාර්ච්මන්ට් සොයා ගන්නා ලද්දේ පර්ගමම්වල රජ කළ දෙවන ඉයුමිනස් රජුය. ඔහු විසින් පාර්ච්මන්ට් යොදා ගෙන පුස්තකාලයක් ද ගොඩ නගා තිබෙන බව වාර්තා වේ.

ශ්‍රී ලංකාවේ අතීත දැනුම බොහෝ ප්‍රමාණයක් එක් රැස්කොට තැබුවේ පුස්කොළ පොත් තුළය. ඒවා මෙරට ප්‍රධානම ලේඛන මාධ්‍ය වී තිබුණේ යැයි සිතීම අතිශයෝක්තියක් නොවේ. විවිධ රජවරු විසින් පුස්කොළ පොත් සඳහා භාවිතයට ගැනෙන තල් ගස් වැවීම සඳහා වෙනම ගම්වර වෙන් කොට තිබීමෙන් පුස්කොළ පොතට අතීත ශ්‍රී ලංකාවේ කුමන තත්ත්වයක් තිබුණේදැයි පැහැදිලිය. පුස්කොළ පොත් නිර්මාණයේදී ඒවාට අවශ්‍ය අමුද්‍රව්‍ය නිෂ්පාදනයේ සිට පොත සකස් කර ගැනීම, අක්ෂර ලිවීම, කළු මැදීම, සංරක්ෂණය කිරීම, වන්දනා කිරීම ආදී ඒ හා සම්බන්ධ සංස්කෘතියක් දක්නට ලැබුණි. මෙරට දී අපට හමුවෙන පැරණිම පුස්කොළ පොත 13 වන සියවසයට අයත් චුල්ල වග්ග පාලියයි (වීරසිංහ, 2002). දැනට මෙරට විශාලම පුස්කොළ පොත් එකතුව ඇත්තේ ජාතික කෞතුකාගාර පුස්තකාලයේය. එහි පුස්කොළ පොත් පන්දාහක් පමණ තිබේ. දෙවන විශාලම පොත් එකතුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාලයේ තිබේ. විවිධ දේශපාලනික, නිකායික සහ විදේශ බලපෑම් මත මෙරට තිබූ දහස් ගණනක් වූ පුස්කොළ පොත් විනාශ වී හෝ රැගෙන ගොස් තිබේ. බ්‍රිතාන්‍ය කෞතුකාගාර පුස්තකාලයේ එවැනි පුස්කොළ පොත් විශාල ප්‍රමාණයක් අදටත් දැකගත හැකිය.

මීට අමතරව චීනය වැනි රටවල විවිධ ලේඛන ද්‍රව්‍යයන් භාවිත වී තිබේ. බම්බු ලේඛන සිල්ක් රෙදි සත්ව ඇටකටු ඉන් කීපයකි. බම්බු ලේඛන සඳහා යොදා ගෙන තිබෙන්නේ උණ ගසේ කොටස්ය. ක්‍රි. ව. 281 දී චීනයේ රජ කළ පාලකයෙකුගේ සොහොනක් විවෘත කිරීමේදී එහි තිබී බම්බු ලේඛන ලක්‍ෂයකට වඩා ප්‍රමාණයක් හමු වී තිබේ. සේද රෙදි ලේඛන ඉතා අලංකාර වූ අතර විචිත්‍රවත්ද විය. පේන කියන ඇටකටු ලෙස ජනප්‍රිය වී තිබූ චීනයේ ඇටකටු ලේඛන ද බහුලව දැකිය හැකිය. මේවා සකස් කර ගැනීමේ සුවිශේෂ තාක්‍ෂණ ක්‍රමවේදයන්ද එකල පැවතුණි. බොහෝ විට මිනිසාට සමීප ගවයන් වැනි සතුන්ගේ අස්ථි මේවා නිර්මාණයට යොදා ගෙන තිබේ. බහුලව නොවූවත් ලී පුවරු ලෝහ තහඩු සහ ගස්වල පොතු ද ලේඛනය සඳහා යොදා ගෙන තිබේ. විශේෂයෙන් ලෝහ අතර රන් තඹ ආදී තහඩුවල අක්‍ෂර ලියා ඇත. ලංකාවේ ද රජවරු සහ ප්‍රභූවරු රන් තහඩු, තඹ තහඩු ලේඛනය සඳහා යොදා ගත් අවස්ථා දැක ගත හැකිය. බොහෝ විට රන් භාවිත කෙරෙන්නේ විශේෂ පණිවුඩ ආදිය සටහන් කිරීම සඳහාය. නොඑසේ නම් පූජනීය ලියවිලි සඳහාය.

රාජකීය දීමනා තඹ රිදී හෝ රන් පත්වල ද සමහර අවස්ථාවන්හි රජෙකු විසින් තවත් රජෙකු වෙත යවන ලද වැදගත් හසුන් සහ මංගල හසුන් රන්පත් වල ද ලියා ඇත. දේවානම්පියතිස්ස රජු විසින් අනාගතයෙහි පහළ වන දුටුගැමුණු නම් රජෙක් රුවන්වැලි සෑය කරවන බව රන්පතක ලියා රජගෙයි වූ කරඬුවක තැන්පත් කර තිබුණි. මිහිඳු මාහිමියන් දිවැසින් අනාගතය බලා කී පරිදි අනාගතයෙහි දුටුගැමුණු නම් රජෙක් රුවන්වැලි සෑය පමණක් නොව ලෝවාමහාපාය ද කරවන බව රන්පතක ලියා රාජ භාණ්ඩාගාරයේ රන් කරඬුවක තැන්පත් කළ බව සද්ධර්ම රත්නාකරයේ සඳහන් වේ (රණසිංහ, 2006).

ඊට අමතරව දුනුකේ පත්, වස්ත්‍ර ආදියද ලිවීමට සහ චිත්‍ර ඇඳීමට යොදා ගෙන තිබේ. වළගම්බා රජු මහාතිස්ස හිමියන්ට වැටකේ පතක ලියා සංඝ භෝග දුන් බවත් මහාවංශයේ සඳහන්ය. තවද දුටුගැමුණු රජුට ලෝවාමහාපාය කරවීමට සැලැස්මක් රහතන් වහන්සේලා විසින් භරණී නම් දෙවඟනගේ දිව්‍ය විමානය පෙතිකඩක ඇඳගෙන පැමිණි බව සද්ධර්මරත්නාකරයේ දැක්වේ (රණසිංහ, 2006).

මෙලෙස ක්‍රි. ව. 105 දී චීන ජාතික ත්සායිලුං විසින් කඩදාසිය හඳුන්වා දීමට ප්‍රථම සහ පසුවත් ආදි කාලීන මානවයා විවිධ ස්වභාවික ද්‍රව්‍යයන් ලේඛන මාධ්‍ය වශයෙන් භාවිත කොට තම ලේඛන අවශ්‍යතාවන් සපුරාගෙන ඇති අතර එක් එක් රටවලට හා සංස්කෘතීන්ට අනුව ඒවා විවිධ වූ බවත් දීර්ඝ කාලීනව පැවතිය හැකි මාධ්‍යයන් පමණක් ඉතිරි වී වෙනත් ලේඛන මාධ්‍යයන් අභාවයට යන්නට ඇති බවත් පැහැදිලිය.

ශ්‍රී ලංකාවේද වසර දෙදහස් පන්සීයකට අධික ඉතිහාසයක් ලේඛන කලාවට තිබෙන අතරම කලින් කලට විවිධ ලේඛන ද්‍රව්‍යයන් භාවිත කර ඇති අතර නොනැසී පැවති ඇතැම් ලේඛන මාධ්‍යයන් අදටත් පුරාවිද්‍යා කැණීම් මගින් හමු වේ.

ආදි කාලීන මිනිසාගේ සිට වර්තමාන ඩිජිටල් යුගයේ මිනිසා දක්වා ක්‍රමයෙන් ඔවුනොවුන් අතර සන්නිවේදනය සඳහා විවිධ සංකේත හා භාෂාවන් නිර්මාණය කර ගත් අයුරුත්, එක් එක් මිනිසා විසින් රැස් කර ගත් දැනුම සමාජයක් වශයෙන් ආරක්ෂා කර ගැනීම සඳහා ලේඛන ක්‍රමවේදය නිර්මාණය කරගත් අයුරුත්, ඒ සඳහා තමන් ජීවත් වූ පරිසරයේ බහුලව දක්නට ලැබෙන ලියා තැබිය හැකියැයි සිතූ ලේඛන මාධ්‍යයන් භාවිතයට ගත් අයුරුත් මෙම කරුණු මගින් පැහැදිලිව සනාථ කළ හැක.

## ආශ්‍රිත ග්‍රන්ථ


1. අභයසිංහ, ඒ.ඒ. සහ රාජපක්ෂ, ආර්. එම්. ඩබ්. සංස්. (1989), භාෂා විඥාන : භාෂා විෂයක ලිපි සංග්‍රහය, අභයරත්න මුද්‍රණාලය, රදාවාන.
2. අරංගල, රත්නසිරි, (1992), සිංහලයේ සම්භවය සහ ජුලියස් ද ලැනරෝල්ගේ සිංහලයෙහි න-ණ-ල-ළ භාවිතය, ගොඩගේ, කොළඹ.
3. අලගියවන්න, පුවතිසි සම්. (2004), සංස්කෘත සිංහල ශබ්දකෝෂය, සූරිය ප්‍රකාශකයෝ, කොළඹ.
4. බණ්ඩාර, තිස්ස (2007), මහනුවර අස්ගිරි මහාවිහාර පුස්කොළ ලේඛන පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක අධ්‍යයනයක්, සමාජ විද්‍යාපති උපාධිය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.
5. බලගල්ලේ, විමල් ජී. (1998), සිංහල භාෂාධ්‍යන ඉතිහාසය, ගොඩගේ, කොළඹ.

6. මුදියන්සේ, නන්දසේන සංස්. (2000), සිංහල ශිලාලේඛන සංග්‍රහය, ගොඩගේ, කොළඹ.

7. රණසිංහ, ආර්. එච්. අයි. එස්. (2006), පැරණි ලංකාවේ පොත්ගුල් සම්ප්‍රදාය, කර්තෘ, කැලණිය.

8. ලංකාගේ, ජයසිරි (1996), සිංහල වර්ණ මාලාවේ විකාශනය, ගොඩගේ, කොළඹ.

9. වජිරකාන්ති, අශෝකා (2013),භාෂණය හා ලේඛණය, [මාර්ගගත] " Available at:http://aksharamalawa.blogspot.com/2013/07/blog-post_8976.html

10. සන්නස්ගල, පී. බී. සංස්. (1992), සිංහල ශබ්දකෝෂය, 22 කාණ්ඩය හෙවත් 42 වන භාගය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ.

11. සිරිසුමංගල හිමි, මඩිතියවෙල සම්. (1965), පාලි සිංහල ශබ්දකෝෂය, ගුණසේන, කොළඹ.

12. සිල්වා, හරිස්චන්ද්‍ර (1993), ලේඛන ඉතිහාසයේ ප්‍රභවය හා විකාශය, පුවත්පත් කලා සමීක්ෂා, 3 (2) පි. 1-4

13. හෙට්ටිආරච්චි, ඩී. ඊ. සංස්. (1970), සිංහල විශ්වකෝෂය, 1 කාණ්ඩය, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යංශය, කොළඹ.